**වහාම ප්‍රකාශයට පත්කිරීම පිණිසයි**

## ලෙබනනය ෑ ගෘහ සේවක සේවිකාවන් ආරක්ෂාකිරීමට අධිකරණ පද්ධතිය අපොහොසත්වීම

***නොසැලකිල්ල, නඩු විභාග සඳහා දීර්ඝ කාලයක් ගතවීම සහ අයිතිවාසිකම් සීමාකෙරෙන අනුග්‍රහ දැක්වීමේ ක්‍රියාපිළිවෙළ මගින් යුක්තිය පසිඳලීම අසාර්ථකවේ***

(බේරූට්, 2010 සැප්තැම්බර් 16 )- ලෙබනනයේ හාම්පුතුන් ගෘහ සේවයේ නිරත සංක්‍රමණිකයන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කරන අවස්ථාවල හාම්පුතුන්ට දඬුවම් පැමිණවීමට සාමාන්‍යයෙන් අධිකරණය අපොහොසත් වන බව හියුමන් රයිට්ස් වොච් සංවිධානය අද නිකුත්කරන ලද නිවේදනයකින් සඳහන්කරයි. මෙම සේවක සේවිකාවන් තම අයිතිවාසිකම් ආරක්ෂාකරගැනීම සඳහා අධිකරණයේ පිහිට පැතීම සහතික කරනුවස් ලෙබනන ආණ්ඩුව සැලසුමක් සකස්කලයුතු බව හියුමන් රයිට්ස් වොච් සංවිධානය පවසයි.

”අනාරක්ෂිතයෝඃ ගෘහ සේවයේ නිරත සංක්‍රමණිකයන් ආරක්ෂාකිරීමට ලෙබනනයේ අධිකරණ පද්ධතිය අපොහොසත්වන අන්දම” මැයෙන් යුත් පිටු 54ක වාර්තාව සංක්‍රමණික ගෘහ සේවක සේවිකාවන්ට බලපාන ලෙබනනයේ අධිකරණ තීන්දු 114ක් විමර්ෂණයට ලක්කරයි. පහසුවෙන් පැමිණිලි ඉදිරිපත්කිරීම සඳහා ක්‍රියාදාමයක් නොමැතිවීම, නඩු විභාග කිරීම සඳහා දීර්ඝ කාලයක් ගතවීම සහ වීසා බලපත්‍ර ලබාදීම සීමාකිරීමේ ප්‍රතිපත්ති නිසා බොහෝ කම්කරුවන් තම හාම්පුතුන්ට එරෙහිව පැමිණිලි කිරීමෙන් වලක්වාලනු ලබන බව එම වාර්තාවෙන් හෙලිවේ. කම්කරුවන් පැමිණිල්ලක් ඉදිරිපත් කල අවස්ථාවල පවා, ගෘහ සේවක සේවිකාවන්ට එරෙහිව කෙරෙන ඇතැම් අතවර අපරාධයන් ලෙසින් සැලකීමට පොලීසිය සහ අධිකරණ බලධාරීහු බොහෝවිට අපොහොසත්වෙති.

“ගෘහ සේවයේ නිරතවූවන්ගේ අයිතිවාසිකම් උල්ලංඝණය කෙරෙන අවස්ථා නොතකා හැරීම මගින් හාම්පුතුන් විසින් පහසුවෙන් අනතුරට ගොදුරුවන මෙම කණ්ඩායමට එරෙහිව කෙරෙන උල්ලංඝණයන්ට ලෙබනනයේ පොලීසිය සහ අධිකරණයද හවුල්වන,” බව බේරූට් නුවර සිටින හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ අධ්‍යක්ෂ නදීම් හවුරි පවසයි. “අතවරයට ලක්වන තැනැත්තාගේ අනන්‍යතාවය කවරක් වුවද කිසිවෙකු සිරකර තැබීම හෝ කම්මුලට පහරදීම අපරාධයකි.”

කම්කරුවන් නිවස තුල සිරකර තැබීම, ඔවුන්ගේ ගමන් බලපත්‍ර තම භාරයට ගැනීම, හෝ කම්කරුවන්ට ආහාර නොදීම වැනි  උල්ලංඝනයන් නිරන්තරයෙන් සිදුවුවද එවැනි එක් අවස්ථාවකදීවත් හාම්පුතුන්ට එරෙහිව චෝදනා ඉදිරිපත්වූ අවස්ථාවක් හියුමන් රයිට්ස් වොච් සංවිධානය විමර්ෂණයට ලක්කල සිදුවීම් 114දීම දැකගන්නට නොලැබුනි. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ, ඉතියෝපියාවේ, පිලිපීනයේ සහ නේපාලයේ සිට පැමිණෙන ගෘහ සේවක සේවිකාවන් ලක්ෂ දෙකක් පමණ ලෙබනන පවුල්වල සේවයට බඳවා ගැනේ.

මෙම සේවක සේවිකාවන් විසින් හාම්පුතුන්ට එරෙහිව ඉදිපත්කරන පැමිණිලි බොහෝවිට මාස ගණන් හෝ ඇතැම්විට අවුරුදු ගණන් අධිකරණවල විභාගනොවී පවතී. ලෙබනනයේ දැඩි වීසා විධිවිධානවලට අනුව, එවැනි චෝදනා විභාගවී හමාරවනතුරු ඔවුන්ට රටේ රැඳීසිටීමද දුෂ්කර නිසා මේ තත්ත්වය මගින් කම්කරුවන් කෙරෙහි එල්ලවන පීඩනය තවත් දැඩි කරයි. තම හාම්පුතුන්ට එරෙහිව කම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද අපරාධ සම්බන්ධ පැමිණිලි 13ක් හියුමන් රයිට්ස් වොච් සංවිධානය නිරීක්ෂණය කරන ලද අතර, එවැනි පැමිණිල්ලක් විභාගවී හමාරවීමට සාමාන්‍යයෙන් මාස 24ක් ගතවන බව අනාවරණය විය. වේතන නොගෙවීම පිලිබඳ පැමිණිලි විභාගවීමට මාස 21 සිට මාස 54 දක්වා කාලයක් ගතවිය. කම්කරු උසාවියට ඉදිරිපත්කරන ලද සාමාන්‍ය පැමිණිල්ලක් පවා විභාගවීමට සාමාන්‍යයෙන් මාස 32ක් ගතවේ. කෆීල් හෙවත් කම්කරුවන්ට අනුග්‍රහය දැක්වීමේ ක්‍රියාදාමයට අනුව, පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට පවා තම හාම්පුතාගෙන් ඉවත්වයන කම්කරුවෙකුට තවදුරටත් ලෙබනනයේ වාසය කිරීමේ අයිතිය අහිමිවන අතර, එවැන්නෝ අත්අඩංගුවට පත්වීමේ සහ රටින් පිටුවහල් කරනු ලැබීමේ අනතුරට මුහුනදෙති.

සංක්‍රමණික ගෘහ සේවක සේවිකාවන්ට එරෙහිව සිදුකෙරෙන ශාරීරික අතවර සම්බන්ධයෙන් සාමාන්‍යයෙන් පොලීසියෙන් සහ නඩු පවරන අංශවලින් පලවන්නේ උදාසීන ප්‍රතිචාරයකි. 2005දී වාර්තාවූ එක් සිදුවීමකට අනුව, හාම්පුතෙකු ගෘහ සේවයේ නිරතවූවෙකුට පහරදෙන බවට පැමිණිල්ලක් ලැබීමෙන් අනතුරුව ඒ' පිලිබඳව පොලීසිය පරීක්ෂණ ආරම්භ කලේ දින 21කට පසුවය. පොලීසිය නිරන්තරයෙන් හාම්පුතුන්ගෙන් සාමාන්‍ය ප්‍රශ්ණ කීපයක් පමණක් විමසන බවත්, ඔවුන්ගේ සාක්ෂි පිලිබඳව වෙනත් සාක්ෂිකරුවන්ගෙන් විමසාබලා තහවුරු කරගැනීමකින් තොරව හාම්පුතුන්ගේ සාක්ෂිය සත්‍යය ලෙසින් පිලිගන්නා බවත් මෙම සේවකයන්ට එරෙහි ප්‍රචණ්ඩක්‍රියා සම්බන්ධ පොලිස් වාර්තා බොහොමයක් විමර්ෂණයට ලක්කලවිට දක්නට ලැබුනි.

ගෘහ සේවයේ නිරත සංක්‍රමණිකයන්ට දරුණු අන්දමින් පහරදීමේ ඇතැම් සිදුවීම් සම්බන්ධයෙන් බලධාරීන් නීතිමය පියවර ගෙන තිබුනත්, එවැනි අවස්ථා ඉතා දුර්ලභ අතර එවැනි අවස්ථාවල ලබාදී තිබෙන්නේද ඉතා සුලු දඬුවම් පමණි. බොහෝ ප්‍රශංසා ලැබූ එක් සිදුවීමකදී පිලිපීන ජාතික ගෘහ සේවිකාවකට දිගින් දිගටම පහරදීම සම්බන්ධයෙන් ලෙබනනයේ අපරාධ අධිකරණය විසින් 2009 දෙසැම්බර් 9 වැනිදින හාම්පුතෙකුට සිරදඬුවම් පණවන ලදි. එහෙත් එය දින 15ක සිරදඬුවමක් පමණි. ගෘහ සේවයේ නිරතවූවෙකුට පහරදීම සම්බන්ධයෙන් හියුමන් රයිට්ස් වොච් සංවිධානය දන්නා පරිදි හාම්පුතෙකුට ලබාදී තිබෙන දැඩිම දඬුවම මාසයක් සිරගත කිරීම පමණි. අපරාධ අධිකරණය විසින් 2010 ජුනි 26 වැනිදින එම දඬුවම පණවන ලද්දේ ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවක බලහත්කාරයෙන් නිවසෙහි හිරකර තබාගෙන ඇයට දිගින් දිගටම පහරදුන් හාම්පුතෙකුට එරෙහිවය.

තම කම්කරුවන් ඝාතනය කරන හාම්පුතුන්ට පවා සාමාන්‍යයෙන් පැණවෙන්නේ ඉතා ලිහිල් දඬුවම්ය. 1999දී විභාගකරන ලද එවැනි එක් සිදුවීමකදී, ගෘහ සේවයේ නිරත ශ්‍රී ලාංකිකයෙකු පහරදී මරාදැමූ හාම්පුතෙකුට අපරාධ අධිකරණය විසින් පණවන ලද්දේ වසර එකහමාරක සිරදඬුවමක් පමණි.

"මෙම නඩු තීන්දු යහපත් දිශාවට තැබූ කුඩා පියවරයන් වනමුත්, ඒ'වා මෙවැනි වැරදි සම්බන්ධයෙන් පණවන ලද ඉතා සුලු දඬුවම් පමණක්," බව හවුරි පැවසීය. "ගෘහ සේවක සේවිකාවන්ට අතවර කරන හාම්පුතුන්ට තම වරදේ ප්‍රමාණයට දඬුවම් කරමින් අනෙක් හාම්පුතුන්ද එවැනි වැරදිවලින් වැලැක්වීමට බලධාරීන් වගබලාගත යුතුය."

ගෘහ සේවයේ නිරත සංක්‍රමණිකයන්ට සොරකමක් වැනි අපරාධයක් සම්බන්ධයෙන් චෝදනා එල්ලවන අවස්ථාවලදී නියමිත ක්‍රියාදාමය උල්ලංඝණය කෙරෙන සහ එම සේවකයන්ට සාධාරණ නඩු විභාගයකට මුහුණදීමේ අයිතිය අහිමිකෙරෙන සිදුවීම් ගණනාවක්ම හියුමන් රයිට්ස් වොච් සංවිධානය විසින් ලේඛණගත කරන ලදි. හියුමන් රයිට්ස් වොච් සංවිධානය විසින් විමර්ෂණයට ලක්කරන ලද, ගෘහ සේවයේ නිරතවූවන්ට එරෙහිව අපරාධ චෝදනා නැගුනු සිදුවීම් 84කින් සිදුවීම් 37කදීම, එනම් සියයට 44ක ප්‍රතිශතයකට, ඔවුන් වෙනුවෙන් නීතිඥයෙකු පෙනීසිටියේ නැත. මෙම සංක්‍රමණිකයන්ගෙන් බොහෝදෙනා හොඳින් අරාබි භාෂාව කතානොකරන නමුත් එම සිදුවීම්වලින් අති බහුතරයකදී-එනම් සිදුවීම් 84න් 57කදීම-ඔවුන්ට පොලීසියේ සහ අධිකරණයේ පෙනීසිටීමට සිදුවූයේ සහතිකලත් භාෂා පරිවර්තකයෙකුගේ සහායෙන් තොරවය. බරපතල අපරාධයක් කල බවට අදාල කම්කරුවාට එරෙහිව චෝදනා එල්ලවන අවස්ථාවලදී පවා භාෂා පරිවර්තකයන් ලබාදුන් අවස්ථා ඉතා දුර්ලභය.

අපරාධ සම්බන්ධයෙන් චෝදනා ලැබූ සංක්‍රමණික ගෘහ සේවක සේවිකාවන් නඩු විභාගයට පෙර රඳවාතැබීම බහුලව සිදුවන බවද මෙම වාර්තාවෙන් සොයාගන්නා ලදි. විමර්ෂණයට ලක්කරන ලද සිදුවීම් අතුරින් සියයට 76කදීවත් - සිදුවීම් 84න් 64කදීම - මෙසේ නඩු විභාගයට පෙර රඳවාගෙන තිබුනි. ඒ' අතරින් බොහෝදෙනා නිවැරදිකරුවන් බව තීන්දුකෙරුණත් නඩුවිභාගය පැවැත්වුන කාලය අතරතුර ඔවුන් සාමාන්‍යයෙන් මාස තුනක තරම් කාලයක් රඳවා තබාගෙන තිබේ. කෙසේවුවද නිවැරදිකරුවන් බවට අධිකරණය විසින් තීන්දු කිරීමට ප්‍රථම අඩුම තරමින් සිවුදෙනෙකුටවත් මාස අටකට වැඩි කාලයක් බන්ධනාගාරගතව සිටීමට සිදුවිය.

"නීතිඥයෙකුගේ හෝ භාෂා පරිවර්තකයෙකුගේ සහායක් නොලබා ගෘහ සේවක කම්කරුවන් ඔවුන්ගේ හාම්පුතුන්ගේ චෝදනා මත පදනම්ව නිරන්තරයෙන් සිරගත කෙරෙන," බව හවුරි පැවසීය. "චෝදනා විභාගවී හමාර වනතුරු අනෙක්

හැමදෙනෙකු මෙන්ම ඔවුන්ද නිවැරදිකරුවන් ලෙසින් සැලකිය යුතු අතර සාධාරණ නඩුවිභාගයකට මුහුණදීමේ අයිතිය ඔවුන්ටද හිමිවිය යුතුය."

සංක්‍රමණික ගෘහ සේවක සේවිකාවන්ට දැනට වඩා යහපත් ලෙසින් සැලකෙන අන්දමින් වාතාවරණය වෙනස්කිරීමට තමන්ට අවශ්‍ය බව අභ්‍යන්තර කටයුතු හා කම්කරු කටයුතු පිලිබඳ ඇමතිවරයා ඇතුලු ලෙබනන බලධාරීන් මෑතදී නිවේදනය කල නමුත්, එය ක්‍රියාවට නැගීමේදී මෙම කම්කරුවන් අනිවාර්යයෙන්ම සම්මත රැකියා කොන්ත්‍රාත්තුවක් ලබාගතයුතු බවට 2009දී නිකුත්කල නියෝගය වැනි පටු සංශෝධන ක්‍රියාදාමයන්ට පමණක් ආණ්ඩුවේ ක්‍රියාකලාපය සීමාවී තිබේ. ගෘහ සේවයේ නිරත සංක්‍රමණිකයන් සේවයේ යෙදවෙන ආකාරය නිරීක්ෂණය කිරීම සඳහා නිසි වැඩපිලිවෙලක් සකස්කිරීමටද ආණ්ඩුව අපොහොසත්වී තිබේ.

- සංක්‍රමණික ගෘහ සේවක සේවිකාවන්ට එරෙහිව කෙරෙන අපරාධ පිලිබඳව හාම්පුතුන්ට විරුද්ධව එල්ලවන චෝදනා සම්බන්ධයෙන් නඩු පැවරීමේ හැකියාව වැඩිකිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස්කරන ලෙස;
- වැටුප් සම්බන්ධයෙන් සංක්‍රමණික කම්කරුවන් සහ හාම්පුතුන් අතර ඇතිවන මතභේද ඉක්මනින් විසඳාගැනීම සඳහා සරල ක්‍රමවේදයක් සකස්කිරීම පිණිස නීතියක් සම්මත කරන ලෙස;
- අතවරවලට ලක්වෙන හෝ අපරාධයක් සම්බන්ධයෙන් චෝදනා ලබන සංක්‍රමණික ගෘහ සේවක සේවිකාවන්ට සහතිකලත් භාෂා පරිවර්තකයන්ගෙ සහ නීති ආධාර සේවයේ සහාය ලබාගැනීමට අවස්ථාව සලසාදෙනමෙන්;
- ගෘහ සේවයේ නිරත සංක්‍රමණිකයන් අතවරවලට ලක්වීම සම්බන්ධයෙන් ඉදිරිපත්කරන පැමිණිලි හඳුනාගැනීමට සහ ඒවාට ප්‍රතිචාරය පලකිරීම සඳහා විනිශ්චයකරුවන්, ආගමන හා විගමන නිළධාරීනට සහ පොලිස් නිලධාරීන් වෙනුවෙන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනමෙන්; සහ
- කම්කරුවන්ගේ වීසා බලපත්‍ර තවදුරටත් එක් අනුග්‍රාහකයෙකු මත රඳානොපවතින ආකාරයෙන් වීසා බලපත්‍රවලට අනුග්‍රහය දැක්වීමේ ක්‍රියාදාමය ප්‍රතිශෝධනය කොට අත්අඩංගුවට පත්වනු ඇතැයි හෝ රටින් පිටුවහල් කරනු ඇතැයි බියකින් තොරව කම්කරුවන්ට පැමිණිලි ඉදිරිපත්කිරීමට අවස්ථාව සලසාදෙනමෙන්

හියුමන් රයිට්ස් වොච් සංවිධානය ලෙබනන බලධාරීන්ගෙන් ඉල්ලා සිටී.

**"අනාරක්ෂිතයෝ: ගෘහ සේවයේ නිරත සංක්‍රමණිකයන් ආරක්ෂාකිරීමට ලෙබනනයේ අධිකරණ පද්ධතිය අපොහොසත්වන අන්දම" මැයෙන් යුත් හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ සම්පූර්ණ වාර්තාව http://www.hrw.org/node/93006 වෙබ් අඩවියෙන් කියවිය හැකිය.**

**ලෙබනනය සම්බන්ධ හියුමන් රයිට්ස් වොච් සංවිධානයේ වෙනත් වාර්තා සඳහා කරුණාකර:**
http://www.hrw.org/en/middle-eastn-africa/lebanon වෙබ් අඩවියට පිවිසෙන්න.

**වැඩි විස්තර සඳහා කරුණාකර පහත දැක්වෙන අය අමතන්න:**

බේරූට් නුවරදී, නදීම් හවුරි (ඉංග්‍රීසි, ප්‍රංශ, අරාබි ) +961-3-639244 (ජංගම දුරකථනය)